**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 1985 අංක 3 දරන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 19 වන වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය සමඟ සංශෝධිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 හි 39 ඡේදය අනුව මුදල් ප්‍රවාහයන් නොවන රු.14,729,762 ක විදේශ විනිමය ලාභ මුදල් ගලා ඒමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි කොට 2023 වර්ෂයේ ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.45,671,870 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු ආරම්භ කර ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු රු.3,850,000 ක් වූ ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු පාඨමාලා ගාස්තුව රු.4,050,000 ක් ලෙස නිවැරදි විය යුතුය. එම මුදල්, පාඨමාලාව නතරකර ඇති අක්‍රීය ගණයට අයත්වන සිසුන් 15 දෙනෙකුට අදාළ නිසා ගිණුම්ගත කොට නොමැති බව. | වර්ෂයට අදාළ පාඨමාලා ආදායම් නිසිපරිදි හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) ස්ථාවර වත්කම් කාණ්ඩ තුනකට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය රු.422,543 ක් අඩුවෙන් ගණනය කර තිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය හා ස්ථාවර වත්කම් වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | පිරියත හා යන්ත්‍ර ක්ෂය කිරීමේදී සිදුව ඇති ඌන ප්‍රතිපාදනය 2023 වර්ෂයේ දී අතීතානුයෝගීව ගැලපීමට පියවර ගනු ලබන බව. | මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම් නිවැරදිව දැක්විය යුතුය. |
| (ඇ) ඉකුත් වර්ෂයට අදාළව ආපසු ගෙවන ලද රු.1,500,000 පාඨමාලා ගාස්තු ආදායම පොදු සංචිත ගිණුමට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායම් ගිණුමෙන් අඩු කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | EMBA 2021 පාඨමාලා ගාස්තුවලින් ආපසු ගෙවන ලද රු.1,500,000 ක මුදල අතීතානුයෝගීව ගළපා ගිණුම්වාර්තා නැවත ප්‍රකාශ කිරීමට 2023 වර්ෂයේදී පියවර ගනු ලබන බව. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) පෙර වර්ෂවලට අදාළව රු.131,375 ක් වූ ඌන ක්ෂය වෙන් කිරීම් පෙර වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ලාභයට ගැලපීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ක්ෂය ඌනතාවය අතීතානුයෝගීව ගළපා 2023 වර්ෂයේ නැවත ප්‍රකාශ කරනු ලබන බව. | නිවැරදිව ක්ෂය ගණනය කිරීම් කළ යුතුය. |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) පාඨමාලා ආදායම | | | | අගයන්හී වෙනස්වීම්වල ගැලපීම් සිදුකිරීම අවශ්‍ය වුවහොත් ඒ සඳහා වූ ක්‍රියාමාර්ග 2023 වර්ෂයේදී ගනු ලබන බව. | අදාල උපලේඛනවල වටිනාකම් හා මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම් සැසඳිය යුතුය. |
| දේශීය | 262,038,303 | 246,129,783 | 19,990,520 | | |
| විදේශීය | 21,870,340 | 25,952,030 | 4,081,690 | මෙම පාඨමාලා ආදායම සම්පත් බැංකුවෙන් ලද වාර්තා අනුව දෛනික විනිමය අනුපාතයන්ට අනුව නිශ්වය කළ අතර විගණනයේදී මාසික අනුපාතයන්ට අනුව නිශ්වයකල බැවින් රු.4,081,690 ක වෙනසක් වී ඇති බව. | |
| (ආ) ප්‍රකාශන තොගය | 8,003,661 | 5,642,226 | 2,361,435 | 2023 දී අතීතානුයෝගීව ගැලපීමට පියවර ගනු ලබන බව. | නිවැරදි තොග වටිනාකම මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්විය යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 2/2020 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා 2017 අගෝස්තු 23 දිනැති අංක DMS/0011/PIM දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර ගැනීමකින් තොරව ආයතනය විසින් කළමනාකරණ උපදේශක තනතුරු 04 ක් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ උපදේශක තනතුරු 06 ක් සඳහා කොන්ත්‍රාත් පදනමින් නිලධාරීන් බඳවා ගෙන තිබුණි. | 2020 ඔක්තෝබර් 26 දිනැති මුදල් චක්‍රලේඛය නිකුත් කර ඇත්තේ රාජ්‍ය අංශයේ ආයතන සඳහා "අනුමත තනතුරුවලට" බඳවාගැනීම හා පුරප්පාඩු පිරවීමටය. මෙහි "අනුමත තනතුරු" යනු ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් තනතුරුවන අතර කළමනාකරණ මණ්ඩලය අනුමත කර ඇති බඳවාගැනීමේ පටිපාටියට අනුව කොන්ත්‍රාත් පදනමට බඳවා ගෙන ඇති බව. | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2022 ජුනි 10 දිනැති අංක 03/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතන චක්‍රලේඛය | විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට අදාල අයදුම්පත් නැවත දැනුම් දෙන තුරු ඉදිරිපත් නොකරන ලෙස චක්‍රලේඛ උපදෙස් ලබාදී තිබුණද 2021 වර්ෂයේ විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකු චක්‍රලේඛ දිනෙන් පසුවද කොන්ත්‍රාත් පත්වීම දීර්ඝ කරමින් සේවයේ යොදවාගෙන තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2022 මැයි 25 දාතමින් අංක 03/2022 චක්‍රලේඛය නිකුත් කොට ඇත්තේ විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන්ට විශ්වවිද්‍යාල පද්ධතියට කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීමේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලිපිය බලපෑමක් වන නිසා විය හැකි බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.160,203,167 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.97,956,285 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 62,246,882 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආයතනයේ පාඨමාලා ආදායම් හා විධායක සංවර්ධන වැඩසටහන් ආදායම් හා වෙනත් ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලයට අනුව නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුර සඳහා ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත නියෝජ්‍ය මූල්‍යාධිකාරීන් දෙදෙනෙකු 2022 මැයි සිට සේවයේ යොදවා තිබීම හේතුවෙන් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන තිබෙන නියෝජ්‍ය මූල්‍යාධිකාරී වෙත 2022 මැයි මාසයේ සිට දෙසැම්බර් දක්වා රු.1,818,960 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | ස්ථිර කාර්ය මණ්ඩලයට නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුරු එකක් පමණක් ඇතුළත් අතර 2021 වර්ෂයේ අවසානය දක්වා එම තනතුරේ කාර්යයන් විශ්වවිද්‍යාල පද්ධතියේ ජ්‍යෙෂ්ඨ මූල්‍ය නිලධාරියෙකු විසින් සිදුකරන ලදී.<br><br>එම නිලධාරියාගේ පලපුරුද්ද, ආයතනයේ කටයුතු පුළුල් වීම හා විවිධාංගීකරණය වීම නිසා විශ්‍රාමික එම නිලධාරියාගේ සේවය තවදුරටත් ලබාගැනීම යෝග්‍ය බව තීරණය කරන ලදී. එසේම කොන්ත්‍රාත් පදනම මත පත්කරන ලද විශ්‍රාමික නියෝජ්‍ය මූල්‍යාධිකාරිගේ රාජකාරී කටයුතු පැහැදිලිව වෙන්කොට ඇති අතර වැටුපට අමතරව කිසිදු ප්‍රතිලාභයකට හිමිකම නොපාන බව. | අනුමත කාර්ය මණ්ඩල තනතුරු ඉක්මවා බඳවා ගැනීම් සිදු නොකල යුතුය. |